ශීර්ෂය 275 - පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 275 - පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන**,** වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්**,** ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර**,** එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) මූලධන වියදම්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 කට අයත් නිල සෙවන ගොඩනැගිලිවල වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි.	තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේනතුව වෙත ඉදිරිපත් කර ඇති බව	විධිමත් වැඩපිළිවෙලක් යොදා වත්කම් තක්සේරු කර නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

(ආ) විගණන සාක්ෂි නොවීම

	විගණන නිරීක්ෂණ	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	වැඩ අවසන් නොවූ දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිපාලන සංකීර්ණය ඉදිකිරීම I, II, III අදියරවලට අදාළව මෙතෙක් දරා තිබූ සම්පූර්ණ වියදම රු.මිලියන 2,024 ක් වුවත්, කෙරීගෙන යන වැඩ යටතේ රු. මිලියන 1,893 ක් පමණක් ගිණුම්ගත කර තිබීම හේතුවෙන් රු. මිලියන 131 ක නොසැසඳීමක් නිරීක්ෂණය වූ අතර, එම වෙනස හඳුනා ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	2018 වර්ෂයේදී ITMIS PROGRAMME කිරීමට පෙර ගිණුම්ගත කළ අගයන් එයට ඇතුළත්ව නොතිබූ බැවින් ගිණුම්ගත කිරීමේදී වෙනසක් පෙන්වා ඇති බව	නිසි පරිදි සැසඳුම් සිදු කර නිවැරදි ශේෂය මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුය.

(ii)	දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිපාලන සංකීර්ණය ඉදිකිරීමේ අදියර III හි ගෘහ භාණ්ඩ සපයා ගැනීම සඳහා වැය කරන ලද රු.මිලියන 283 ක වියදමට අදාළ පිරිවිතර හා භාණ්ඩ භාරදීමේ ලියකියවිලි, සමීක්ෂණ වාර්තා විගණනය සඳහා ඉදිරිපත් නොවීම හේතුවෙන් සිදු කරන ලද වියදම් විගණනයේ දී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.	අදියර III ට අදාළ ප්‍රමාණ පත්‍රයේ පිටපතක් මේ සමඟ ලබා දෙන බව.	වියදම් සනාථ කිරීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය.
(iii)	දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිපාලන සංකීර්ණය ගිවිසුම් ගත කාල සීමාවේ දී ඉදිකිරීම් කටයුතු නිම නොකිරීම හේතුවෙන් පසුව ඇති වූ මිල ඉහළ යාම සඳහා පළමු, දෙවන හා තෙවන අදියරයන් සඳහා පිළිවෙලින් රු. මිලියන 39 ක්, රු. මිලියන 92 ක් හා රු. මිලියන 23 ක් ලෙස එකතුව රු. මිලියන 155 ක මිල විචලනයන් සඳහා ගෙවීම් කර තිබූ අතර, අදාළ ගණනය කිරීම්වල නිරවද්‍යතාව තහවුරු කිරීමට අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	ඉංජිනේරු අංශය විසින් බිල්පත් පිටපත් අමුණන ලද ලිපි ගොනු ලබා දී තිබුණු බව	මිල විචලනය පරීක්ෂා කිරීම සඳහා විගණනය ඉල්ලූ සියලුම සාක්ෂි ලබා දීමට කටයුතු කළ යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ 1997 ජනවාරි 13 දිනැති අංක 102 දරන ප්‍රාදේශීය පරිපාලන චක්‍රලේඛය මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ආදායම් සහතික නිකුත් කිරීමේ දී අයකරනු ලබන ගාස්තු, 1997 පෙබරවාරි 06 දිනැති අංක 351 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින්	ආදායම් සහතික නිකුත් කිරීමේදී රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් 1997 ජනවාරි 13 දින නිකුත් කර ඇති අංක 97/02 දරන චක්‍රලේඛය ප්‍රකාරව ආදායමෙන් සියයට 1 ක ගාස්තුවක් අයකර ආදායම් සහතික නිකුත්	චක්‍රලේඛය ප්‍රකාරව ආදායම් සහතික සඳහා අයකරන ගාස්තුව නිවැරදි අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර විධිමත් පරීක්ෂාවක් සිදු කර අහිමි වූ ආදායම

සියයට 10 කින් වැඩි කරන ලදී. එසේම නැවත 2001 මාර්තු 28 දිනැති අංක 359 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සියයට 15 කින් වැඩි කරන ලද අතර, ඒ අනුව ආදායම් සහතික සඳහා 1997 පෙබරවාරි 6 ට පෙර අයකල ගාස්තුව 2001 මාර්තු 28 දිනට පසු සියයට 1.265 ක් විය යුතු නමුත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සියයට 0.265 ක් අඩුවෙන් ආදායම් සහතික මත ගාස්තු අයකර තිබීම නිසා 2024 වර්ෂයේ රු.මිලියන 1.94 ක ආදායමක් අහිමි වී තිබුණි.	කිරීමට කටයුතු කර ඇත. ඉන් අනතුරුව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති අංක 351 හා 395 දරන චක්‍රලේඛ ප්‍රකාරව සියයට 1.27 ක ගාස්තුවක් අයකර ආදායම් සහතික නිකුත් කරන ලෙස 2024 නොවැම්බර් 25 දිනැති ලිපිය මගින් දන්වා යවා ඇති බව.	වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගත යුතුය.

3.2 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගොඩනැගිලි ඉදිකිරීම සඳහා 2016 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ ලැබී තිබුණු ප්‍රතිපාදන මුදලින් සියයට 4 සිට සියයට 54 ක අතර ප්‍රමාණයක් ඉතිරිවී තිබුණි.	ඉදිකිරීම් ආයතනය කළ වැඩ වටිනාකම් අනුව ඉදිරිපත් කරන බිල්පත් සඳහා ගෙවීම් කර ඇති බව	ඇස්තමේන්තු ඉතාමත් නිවැරදිව හා තාත්විකව සැකසිය යුතු අතර ප්‍රදේශයේ සංවර්ධනය උදෙසා ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ප්‍රශස්ත ලෙස භාවිතා කිරීමට වැඩපිළිවෙලක් සැකසිය යුතුය.

3.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	විමධ්‍යගත අයවැය වැඩසටහනට අදාළව මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් නිකුත් කළ 2023 දෙසැම්බර් 29 දිනැති අංක NPD/DCB/2024/GEN දරන හා අංක MF/02/2023 දරන චක්‍රලේඛය ප්‍රකාරව නිවැරදි ග්‍රාමීය සංවර්ධන ප්‍රවේශයක් තුළින් ප්‍රාදේශීය විෂමතා අවම කරමින් රටේ තිරසර සංවර්ධනයක් ඇති කිරීම මූලික අරමුණ ලෙස ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වලින් බැහැර ව්‍යාපෘති 553 ක් සඳහා රු.මිලියන 70 ක මුදලක් වැයකර තිබුණි.	දිස්ත්‍රික්කය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ඵලදායි ව්‍යාපෘති සඳහා යොදවා ගෙන සාධනීය ප්‍රතිඵල අත්පත් කරගැනීමට උත්සාහ දරා ඇති බව	චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල නොවී අරමුණට පරිබාහිරව ව්‍යාපෘති ව්‍යාපෘති තෝරාගත් පාර්ශව සම්බන්ධයෙන් පියවර ගැනීමටත් අපේක්ෂිත අරමුණු ඉටුවන ආකාරයේ ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතාවය ලබා දීමටත් කටයුතු කළ යුතුය.

3.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි

	විගණන නිරීක්ෂණ	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	විගණනය මඟින් පෙන්වා දී ඇති පරිදි ඉදිරියේ දී කටයුතු කිරීමට සටහන් තබා ගත් බව.	පනතේ නියමයන්ට අනුකූල විය යුතුය.
(ii)	විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියලුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුමකට 2025 සැප්තැම්බර් 16 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර එම විමසුම්වල අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.මිලියන 20.5 ක් විය.	පිළිතුරු ලබාදීමට කටයුතු කරන බව.	නියමිත කාලසීමාවේදී ගණන්දීමේ නිලධාරීගේ කරුණු දැක්වීම් සහිතව පිළිතුරු ඉදිරිපත් කළ යුතුය.

3.5 අවිධිමත් ගනුදෙනු

	විගණන නිරීක්ෂණ	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිපාලන සංකීර්ණය ඉදිකිරීමේදී අදියර I, II,III සඳහා විචලන පිරිවැය ලෙස රු. මිලියන 283 ක් සඳහා ගෙවීම් කර තිබූ අතර ඇස්තමේන්තු ඉක්මවා සියයට 17 ක විචලන ප්‍රතිශතයකින් ඉදිකිරීම් සිදු කිරීම සඳහා ලබා ගත් අනුමැතිය ඉදිරිපත් නොකෙරුණි.	අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත.	අනුමත සීමාවන් ඉක්මවීමේදී ඒ සඳහා විධිමත් අනුමැතියක් ලබා ගැනීම කළ යුතු අතර, එම අනුමැතිය විගණනයට ඉදිරිපත් කළ යුතුය.

(ආ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිපාලන සංකීර්ණය ඉදිකිරීම සම්බන්ධ ගෙවීම් වවුචර් 03 කට අදාළව එකතුව රු.මිලියන12.99 ක් විචලන නියෝග අනුමත කර නොමැතිව ගෙවීම් කර තිබුණි.	අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත.	ගෙවීම් කිරීමට පෙර අදාළ අනුමත කිරීම් ලබා ගත යුතු අතර එසේ කටයුතු නොකළ නිලධාරීන්ට පියවර ගත යුතුය.

3.6 තැන්පත් ශේෂයන්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වර්ෂ 05 ක් ඉක්ම වූ හා වර්ෂ 02 ක් ඉක්ම වූ පිළිවෙලින් රු.මිලියන 164 ක හා රු.මිලියන 32 ක තැන්පතු ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින බව.	විධිමත් පරීක්ෂාවක් කර තැන්පතු ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

3.7 අධිභාර කිරීම්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අංක 12/02 **හා** 2023 දෙසැම්බර් 01 දිනැති වවුචරයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීමේ අදියර II ට අදාළ 36 වන බිල්පතට අනුව රු.මිලියන 9.3 ක් ගෙවා තිබුණි. එම වවුචරයට අදාළ බිල්පත අනුව විචලනවල සමුච්චිත අගය රු.මිලියන 135.7 ක් ලෙස රු.මිලියන 1 ක් වැඩියෙන් ගෙවීම් කර තිබුණි.	අදියර II ට අදාල ව්‍යාපෘතියේ වැඩ සියයට 100 අවසන් කර නොමැති නිසා මෙම අධි ගෙවීම පරීක්ෂා කර, ඉදිරියේ දී ඉදිරිපත් කරන බිල්පතකින් හෝ අවසන් බිල්පතෙන් නිවැරදි කිරීමට කටයුතු කරන බව	වැඩිපුර ගෙවන ලද මුදල අය කර ගැනීමට කටයුතු කළ යුතු අතර, වැඩිපුර ගෙවීමට අදාළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගත යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

	විගණන නිරීක්ෂණ	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	නීතිඥ කාර්යාල ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම සඳහා හිඟුරක්ගොඩ මහේස්ත්‍රාත් අධිකරණ භූමිය තුළ පිහිටි ඉඩම හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව වෙත පවරාදීම පිළිබඳව අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ කිසිදු විරෝධතාවක් නොමැති බවට 2019 ජූලි 27 දිනැති ලිපිය මඟින් හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා, වර්ෂ 06 ක කාලයක් ගතවී තිබුණු නමුත් එම ඉඩම ප්‍රාදේශීය සභාව වෙත පවරාදීමට කටයුතු කර නොතිබුණි.	මෙම භූමිය ප්‍රාදේශීය සභාව වෙත පවරා දීමට අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ විරෝධතාවයක් නොමැති බවට දන්වා එවා ඇති නමුත්, මෙම භූමිය නීතිඥ සංගමයට පවරා දෙන ලෙස ලිඛිතව ඉල්ලීම් කර ඇති බැවින් නීතිඥ සංගමය හා ප්‍රාදේශීය සභාව කැඳවා මෙම ගැටළුවට විසඳුමක් ලබා දෙන ලෙස අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් වෙතින් ඉල්ලීමක් සිදු කර ඇති බව.	අදාළ ආයතන හා සම්බන්ධ වී පවතින එකඟතාවය අනුව මූලික අරමුණු සඳහා ඉඩම පවරා දීමට කඩිනමින් කටයුතු කළ යුතුය.
(ආ)	ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ ගැමිදිරිය ව්‍යාපෘතිය යටතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 06 ක ග්‍රාමීය සංවිධාන 160 ක් පිහිටුවා ඇති අතර, එම ග්‍රාමීය සංවිධාන වෙත රු.මිලියන 517.7 ක මුදලක් ලබා දී තිබුණි. එම ග්‍රාමීය සංවිධාන හඳුනාගෙන ඒවායේ අධීක්ෂණ කටයුතු දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ නමුත්, එවැනි අධීක්ෂණයක් නොවීම හේතුවෙන් වර්තමානය වනවිට ඇතැම් සංවිධාන අක්‍රීය වී තිබුණු අතර, අදාළ සමිති හඳුනාගෙන එම සමිති සක්‍රීය කිරීමටත් බැංකු ගිණුම්වල හා විවිධ පාර්ශව සතුව පවතින මුදල් නැවත එම සමිතිවල අරමුණු සඳහා යොමුකර ගැනීමටත් කටයුතු කර නොතිබුණු අතර, 2024 දෙසැම්බර් 31 දිනට හඳුනා ගෙන තිබූ අක්‍රීය බැංකු ගිණුම් ශේෂයන්ගේ වටිනාකම රු.මිලියන 56.6 ක් විය.	සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙත තොරතුරු ඉල්ලා ලිපියක් යොමුකරන ලද අතර දැනට කොට්ඨාශ මට්ටමෙන් ලැබී ඇති තොරතුරු මත සමිති හඳුනා ගනිමින් පවතින අතර සක්‍රීය සමිති විගණනයට ලක් කර ක්‍රියාකාරීව තබා ගැනීමට උත්සාහ කරමින් සිටින බව	ග්‍රාමීය සංවිධාන හඳුනාගෙන ඒවායේ අධීක්ෂණ කටයුතු දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් සිදු කිරීමට වැඩපිළිවෙලක් සකසා ක්‍රියාත්මක කළ යුතුය.

4.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

	විගණන නිරීක්ෂණ	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගම සමඟ පිළිසඳර 2022 ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ පවුල් ඒකක සඳහා කිකිළි පැටවුන් ලබාදීම මඟින් ග්‍රාමීය ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය හා බිත්තර ලබාගැනීම තුළින් පවුලේ පෝෂණය ඉහළ නැංවීමේ අරමුණින් යුතුව පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් පවුල් ඒකක වෙත රු.මිලියන 11.6 ක් වටිනා කිකිළි පැටවුන් 28797 ක් ලබා දී තිබුණි. එයින් රු.මිලියන 09 ක් වටිනා කිකිළි පැටවුන් 22265 ක් මියයාම හේතුවෙන් සැපයම්කරු එළඹි ගිවිසුම් ප්‍රකාරව නැවත කිකිළි පැටවුන් ලබාදීමට කටයුතු කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ දී කිකිළි පැටවුන් 3959 ක් පමණක් ලබා දී තිබුණි.	මේ පිළිබඳව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් අඛණ්ඩව පසුවිපරම් කරමින් සිටින අතර, හැකි ඉක්මනින්ම ඉතිරි පැටවුන් ද ගෙන්වා ගෙන ප්‍රතිලාභීන්ට ලබාදීම මඟින් ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට කටයුතු කරමින් සිටින බව	ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර සැපයුම්කරු වෙතින් කිකිළි පැටවුන් ලබා දීමට කඩිනම් පියවර ගත යුතුය.
(ආ)	පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මෙහෙයවීම මත 2019/20 මහ කන්නයේ සිට 2022/23 මහ කන්නය දක්වා ක්‍රියාත්මක කරන ලද වී මිලදී ගැනීමේ වැඩසටහන් යටතේ රජයට ලැබිය යුතු සහල් කිලෝ ග්‍රෑම් 4,816,652 ක් ලබා නොදීම හේතුවෙන් රු.මිලියන 395 ක මුදලක් තවදුරටත් වී මෝල් හිමියන්ගෙන් අයකර ගත යුතුව පැවතුණි.	අය කර ගැනීමට කටයුතු කරමින් පවතින බව	වී මිලදී ගෙන හාල් ලබා දීමේ ක්‍රියාවලිය පිළිබඳ විධිමත් පරීක්ෂණයක් පවත්වා වගකිවයුතු පාර්ශවයන් පියවර ගැනීමටත් හිඟ මුදල් අය කර ගැනීමටත් කටයුතු කළ යුතුය.

4.3 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ඇලහැර, හිඟුරක්ගොඩ, ලංකාපුර හා මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මූල්‍ය නොවන වත්කම්වල ලෙජර් ගිණුම් අංක - 9153 යටතේ ගිණුම්ගත කර ඇති රු.මිලියන 143.94 ක් වටිනා ඉඩම්වල ස්ථිර අයිතිය ප්‍රාදේශීය ලේකම් වෙත පවරාගෙන නොතිබුණි.	ඉඩම් පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින බව	කඩිනමින් කටයුතු කර ඉඩම් අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය.

4.4 පාඩු හා හානි

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිපාලන සංකීර්ණයේ ඉදිකිරීමේ කටයුතු නිම කිරීමට අපේක්ෂා කළ දිනය ඉක්මවා වර්ෂ 06 ක කාලපරිච්ඡේදයක් ගතවී ඇතත්, ඒ සඳහා ප්‍රමාද ගාස්තු අය කරගැනීමක් සිදු කර නොතිබුණු අතර කාර්යාල සංකීර්ණය ඉදි කිරීමේ II වන හා III වන අදියරයේ දී ගෙවීම් සිදු කිරීම ප්‍රමාදවීම හේතුවෙන් රු.මිලියන 4 ක ප්‍රමාද ගාස්තු කොන්ත්‍රාත්කරු විසින් අය කරගෙන තිබුණි.	කොන්ත්‍රාත් වැඩ ප්‍රමාද වීමට හේතු ඉදිරිපත් කර කොන්ත්‍රාත් කල් දිගු අනුමත කර ගෙන ඇති බැවින්, කොන්ත්‍රාත්කරු වෙතින් ප්‍රමාද ගාස්තු අයකළ නොහැකි බව	විධිමත් පරීක්ෂාවක් සිදු කර අසාමාන්‍ය ප්‍රමාදයන් සඳහා ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අය කර ගැනීමට කටයුතු කළ යුතුය.

4.5 අනාර්ථික ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නව පරිපාලන ගොඩනැගිල්ල ඉදි කිරීමට අදාළව 2019 ජුනි 17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව අත්‍යාවශ්‍ය ගෘහ භාණ්ඩ මිල දී ගැනීම සඳහා අදියර III යටතේ අනුමැතිය ලබා දී තිබුණද, රු.මිලියන 1.8 කට මිල දී ගෙන තිබුණු තට්ටු 02 ඇඳන් 26 න් ඇඳන් 6 ක් හා මෙට්ට 52 න් මෙට්ට 12 ක් භාවිතයට නොගෙන ගබඩාවේ තබා තිබුණි. තවද, 2023 වර්ෂයේ දී රු.මිලියන 6.7 කට මුළුතැන්ගෙයි උපකරණ සපයා සවි කරගත් බවට තහවුරු කර ගෙවීම් කර තිබුණද, විගණිත දින වූ 2025 අප්‍රේල් 28 දින වන විටත් එම උපකරණ සවිකර අවශ්‍යතාවයන් සඳහා භාවිතා කර නොතිබුණි.	නව කාර්යාලය තුළ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ආයතන 28 ක් හා උපදේශන ආයතන පිහිටුවීමට යෝජනා කර ඇති බැවින්, එම ආයතනවල රියදුරන් සඳහා විවේක කාමරවලට අවශ්‍ය ඇඳන් ප්‍රමාණය ඇනවුම් කර තිබූ අතර දැනට සත්‍ය වශයෙන්ම විවේක ගන්නා රියදුරන් ප්‍රමාණයට ඇඳන් වෙන්කර විවේක කාමරය සකස් කර ඉතිරි ඇඳන් ගබඩා කර ඇත. ඒවා නිසි ක්‍රමවේදයකින් රජයේ කාර්යාල හෝ ආයතනවලට ලබාදීමට ඉදිරියේ දී කටයුතු කරන බව හා මුළුතැන්ගෙයි උපකරණ සපයාගෙන ඇතත්, පසුගිය කාලය තුළ මැතිවරණ රාජකාරී සඳහා ආපන ශාලාව යොදාගත් බැවින් සවි කිරීම් කටයුතු ප්‍රමාද වූ බව	වත්කම් සපයා ගැනීමේ දී ආර්ථිකභාවය කෙරෙහි අවධානය යොමු කර අවශ්‍ය ප්‍රමාණයට වත්කම් සපයා ගත යුතු බවත්, එසේ නොකළ නිලධාරීන් සම්බන්ධ පියවර ගැනීමටත්, අදාළ භාණ්ඩ ලැබී ඇති බවට තහවුරු කර නොගෙන ගෙවීම් කළ නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගැනීමත් කළ යුතුය.

4.6 කළමනාකරණ දුර්වලතා

	විගණන නිරීක්ෂණ	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2000 වර්ෂයේදී වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සුව සේවා පදනම නමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජනතාවගේ සනීපාරක්ෂක පහසුකම් හා පානීය ජල පහසුකම් සැපයීමේ අරමුණෙන් පිහිටුවන ලද අරමුදලේ 2024 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 11.23 ක් පැවති අතර, එම මුදල් අරමුදල පිහිටවීමේ අරමුණ වෙනුවෙන් භාවිතා නොකර වර්ෂ 24 ක කාලපරිච්ඡේදයක සිට බැංකුවේ නිෂ්කාර්යව පැවතුණි.	මේ සම්බන්ධව 2025 පෙබරවාරි 19 දින පැවති 2024 සිව්වන කාර්තුවට අදාළ විගණන හා කළමණාකරණ කමිටු රැස්වීමේ දි සාකච්ඡා කළ පරිදි 2025 පෙබරවාරි 27 දිනැති ලිපිය මඟින් දැනුවත් කිරීමට කටයුතු කරන ලදි. තවද, මේ සම්බන්ධව උපදෙස් ඉල්ලා 2025 මැයි 19 දින ලිපියක් යොමු කිරීමට කටයුතු කළ අතර, උපදෙස් ලද පසු ඉදිරි කටයුතු සිදු කරන බව.	අරමුදල් පිහිටුවා ඒවායේ අරමුණුගත කාර්යය ඉටු කිරීමෙන් තොරව ඉතා දීර්ඝ කාලයක් නිෂ්කාර්යව මුදල් තබා ගැනීමට කටයුතු කළ වගකිව යුතු සියලු පාර්ශව වෙත විධිමත් පියවර ගත යුතු අතර, අරමුදලේ ඉදිරි කටයුතු සඳහා කඩිනමින් තීරණ ගෙන ක්‍රියාත්මක තළ යුතුය.
(ආ)	සමෘද්ධි ප්‍රජා මූල බැංකු 07 ක බොල් ණය අනුපාතය සියයට 11.46 - 47.17 ත් අතර ප්‍රතිශතයක් ගෙන තිබුණු අතර, මෙම බොල් ණය තුළ පවතින අක්‍රමික ස්වරූපයේ ණය හඳුනාගෙන එම ණය අයකර ගැනීම හා ඊට වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව විනයානුකූල පියවර ගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.	විමර්ශන කටයුතු සිදුකරන බව	විධිමත් පරීක්ෂණ පවත්වා බොල් ණය තුළ පවතින අක්‍රමික ස්වරූපයේ ණය හඳුනාගෙන එම ණය අයකර ගැනීමට හා ඊට වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව විනයානුකූල පියවර ගැනීමට කටයුතු කළ යුතුය.

5. මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 හි කාර්ය මණ්ඩල තොරතුරු අනුව ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරුවල පුරප්පාඩු 11 ක් ද, තෘතියික මට්ටමේ තනතුරුවල පුරප්පාඩු 08 ක් ද, ද්විතීක මට්ටමේ තනතුරුවල පුරප්පාඩු 176 ක් ද පැවතුණි.	පුරප්පාඩු පිළිබඳ භාණ්ඩාගාරයට වාර්තා කර ඇති බව	කාර්ය මණ්ඩල සමාලෝචනයක් සිදු කර අත්‍යවශ්‍යම පුරප්පාඩු පමණක් පිරවීමට කටයුතු කළ යුතුය.